# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1923/43 - 2015 ජූලි මස 15 වැනි බදාදා - 2015.07.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### වයඹ පළාතේ පළාත් සභාව

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසානභූමි පිළිබඳ ආඥාපනතේ II පරිච්ඡේදයේ 5(I) යටතේ කරනු ලබන දැන්වීම

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ දෙවැනි වගන්තියේ (II) වැනි උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසානභූමි පිළිබඳ ආඥාපනතේ II පරිච්ඡේදයේ 5(I) වගන්තියේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වන ජයසේකර පතිරන්නැහැලාගේ දයාසිරි පත්මකුමාර ජයසේකර වන මා විසින් වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උඩුබද්දාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත උපලේඛන I හා II හි සඳහන් සුසාන මළමිණී වැළලීම් හෝ ආදාහනය කිරීම පිණිස පොදු සුසානභූමි ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

නීතිඥ ජේ. පී. දයාසිරි පත්මකුමාර ජයසේකර,<br>
වයඹ පළාත් ප්‍රධාන අමාත්‍ය හා මුදල් ක්‍රමසම්පාදන,<br>
නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලනය,<br>
මානව සම්පත්, අධ්‍යාපනය හා සංස්කෘතික කටයුතු<br>
ඉඩම්, පරිසර, සංචාරක, ආයෝජන සම්බන්ධීකරණ,<br>
සමූපකාර සංවර්ධන සහ ආහාර සැපයුම් හා<br>
බෙදාහැරීම් අමාත්‍ය.<br>
වයඹ පළාත.

2015 ජූලි මස 15 වැනි දින,<br>
කුරුණෑගල ප්‍රධාන අමාත්‍ය කාර්යාලය.

### උපලේඛනය 01

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, බිංගිරිය ආදයම් පාලන නිලධාරී කොට්ඨාසයට අයිති කටුගම්පල හත්පත්තුවේ, යගම්පත්තු කෝරළයේ, පහළ වීරකොඩියාන නැමැති ගමෙහි පිහිටි, සර්වේ ජනරාල් තැන විසින් සාදා තමා භාරයේ තබාගෙන ඇති අංක අයි 11/32 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි 2024 දරන අවසාන ගම් සැලැස්මෙහි බිම් කට්ටි අංක 103 වශයෙන් පෙන්නුම් කර ඇති සහ ප්‍රමාණයෙන් රූඩ් දෙකකුත් පර්චස් විසිදෙකක් (අ. 0, රූ. 02, පර්. 22)ක් ඇතැයි ගණන් බලා ඇති උතුරට : ටී. පී. 382197, නැගෙනහිරට : පාර, දකුණට : අධිපාරට ඇර තිබෙන රක්ෂිත බිම, බස්නාහිරට : ටී. පී. 382117 මායිම් වූ මීතීපිටිය නමැති රජයේ ඉඩම.

(අංක පී 3298 දරන රේඛා චිත්‍ර සටහන)

1A - PG 2550— 11 (2015/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය 02**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, බිංගිරිය ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ, කටුගම්පල හත්පත්තුවේ යගම්පත්තු කෝරළයේ, ගහලගස්වල නැමැති ගමෙහි පිහිටි, සර්වේ ජනරාල් විසින් පිළියෙල කරනු ලැබූ ඔහු භාරයේ තිබෙන අංක අයි 12/33 දරන කඩදසියේ අංක 2036 දරන අවසාන ගම් සැලැස්මෙහි බිම් කට්ටි අංක 5 වශයෙන් පෙන්නුම් කර ඇති සහ ප්‍රමාණයෙන් පර්චස් විසිහතක් (අ. 0, රූ. 0, පර්. 27)ක් ඇතැයි ගණන් බලා ඇති උතුරට : බුදංකුඹුර ගම් මායිම්, නැගෙනහිරට : පාර, දකුණට සහ බස්නාහිරට : අංක 06 දරන බිම් කට්ටිය මායිම් වූ මිනීපිටිය නමැති රජයේ ඉඩම.

(අංක පී 2850 දරන රේඛා චිත්‍ර සටහන)

2. ඉහත කී ගයම්පත්තු කෝරළේ, බුදංකුඹුර නමැති ගමෙහි පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙල කරනු ලැබ ඔහු භාරයේ තිබෙන අංක අයි. 12/33 දරන ක්ෂේත්‍ර කඩදසි අංක 2035 දරන අවසාන ගම් සැලැස්මෙහි බිම් කට්ටි අංක 37 වශයෙන් පෙන්නුම් කර ඇති සහ ප්‍රමාණයෙන් රූඩ් එකකුත් පර්චස් තුනක් (අ. 0, රූ. 1, පර්. 03) ඇතැයි ගණන් බලා ඇති බස්නාහිරට සහ උතුරට : ටී. පී. 374133, නැගෙනහිරට : පාර, දකුණට : ගහලගස්වල ගම් මායිම මායිම් වූ බුදංකුඹුර මිනීපිටිය නැමති රජයේ ඉඩම.

(අංක පී. 2851 දරන රේඛා චිත්‍ර සටහන)

07 - 1427

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.